ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව - I | කාලය පැය 01 යි. |
|---|---|---|

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **1 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

---

01. වායුගෝලයේ සංයුතිය අනුව වැඩිම ප්‍රතිශතයක් හිමිකර ගන්නේ .............................................. වායුව යි.
(ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ් / නයිට්‍රජන්)

02. පෘථිවි ප්‍රාවරණයට පහළින් පිහිටි කොටස .......................................................................................... යි.
(කබොල / ශිලා ගෝලය / හරය)

03. භූ ලක්ෂණ සිතියමක පර්යන්ත තොරතුරක් වනුයේ ....................................................................... ය.
(ජනාවාස / පරිපාලන මායිම් / පරිමාණය)

04. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් .................................. නගරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. (රන්න / අම්බලන්තොට / බෙලිඅත්ත)

05. බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හැම් විසින් මුල්ම රබර් පැලය රෝපණය කරන ලද්දේ ................................ ය.
(හග්ගල උද්භිද උද්‍යානයේ / අස්ගිරි හෙනරත්ගොඩ උද්‍යානයේ / පේරාදෙණිය උද්භිද උද්‍යානයේ)

06. හම්බන්තොට පිහිටා ඇත්තේ ........................................................................ බල ශක්ති බලාගාරය යි.
(සුළං / තාප / ජල)

07. ලෝකයේ ප්‍රධාන ගිනි කන්දක් වන "ක්‍රැකටෝවා" ගිනිකන්ද පිහිටියේ ..........................................................
(නවසීලන්තයේ ය. / ඉන්දුනීසියා වේ ය. / කැනඩාවේ ය.)

08. කටුනායක හා බියගම යන නිදහස් වෙළඳ කලාප පිහිටා ඇත්තේ ........................................ දිස්ත්‍රික්කයේ ය.
(කොළඹ / පුත්තලම / ගම්පහ)

09. ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් භුවමාරු කර ගැනීම සඳහා කිරිගව සම්පත් මධ්‍යස්ථානයක් ...............................
හි පිහිටුවා ඇත. (කෙරවළපිටිය / කොට්ටුකච්චිය / මීවනපලාන)

10. ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳුනු සුවිශේෂී ශාක විශේෂයක් වන .................................. ගස "කප්රුක" ලෙස හැඳින් වේ. (තේ / පොල් / රබර්)

- **11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "√" ලකුණ ද , වැරදි නම් "x" ලකුණ ද වරහන තුළ යොදන්න.**

11. යුරෝපා රටවල වයස්ගත වූවන්ගේ ප්‍රතිශතය ආසියා රටවලට වඩා ඉහළ අගයක් ගෙන ඇත. (.............)

12. ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක් වන කුෂ්නෙට්ස්ක් කලාපය පිහිටියේ චීනයේ ය. (.............)

13. මෝටර් රථ කර්මාන්තය එකලස් කිරීමේ කර්මාන්තය කි. (.............)

14. හෙල්මළු ක්‍රමයට වී වගාව සිදු කෙරෙන්නේ පහත් තැනිතලා බිම්වල ය. (.............)

15. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාරය ගල්ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපාරයයි.

www.edudept.up.gov.lk

(..............)

- **16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට දැක්වෙන නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

16. ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදා කීපයක් "අ" තීරුවේ දැක්වේ. එම ආපදාවල බලපෑම්වලට ලක්වන ප්‍රදේශ "ආ" තීරුව හා ගැලපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | නියඟය | A | රත්නපුරය |
| 2. | නායයෑම් | B | නුවරඑළිය |
| 3. | ජල ගැලීම් | C | පොළොන්නරුව |
| | | D | යාපනය |

1. A, B, C    2. C, B, A    3. B, A, C    4. B, D, C    (..............)

17. ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතන කීපයක් "අ" තීරුවේ දැක්වේ. එම පර්යේෂණ ආයතන පිහිටි දිස්ත්‍රික්ක "ආ" තීරුව හා ගැලපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | අම්බලන්තොට | A | පොළොන්නරුව |
| 2. | මහඉලුප්පල්ලම | B | හම්බන්තොට. |
| 3. | හිඟුරක්ගොඩ | C | අනුරාධපුරය. |

1. A, B, C    2. C, B, A    3. B, A, C    4. B, C, A    (..............)

18. ලෝකයේ භෞතික ලක්ෂණ කීපයක් "අ" තීරුවෙන් දැක්වේ. ඒවා පිහිටි මහද්වීප "ආ" තීරුව හා ගැලපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | පිරනීස් කඳුවැටිය | A | උතුරු ඇමරිකා මහද්වීපය |
| 2. | ඇට්ලස් කඳු | B | දකුණු ඇමරිකා මහද්වීපය |
| 3. | ඇපලේචියන් කඳු | C | යුරෝපා මහද්වීපය |
| | | D | අප්‍රිකා මහද්වීපය |

1. D, A, B    2. C, D, A    3. D, C, A    4. C, D, B    (..............)

19. ශ්‍රී ලංකාවේ වී වගා කරනු ලබන ප්‍රධාන කලාප කීපයක් "අ" තීරුවේ දැක්වේ. එම කලාපවලට අයත්, වී වගා කරනු ලබන දිස්ත්‍රික්ක "ආ" තීරුව හා ගැලපූ විට ලැබෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | තෙත් කලාපය | A | මොණරාගල |
| 2. | අතරමැදි කලාපය | B | රත්නපුරය |
| 3. | වියළි කලාපය | C | වව්නියාව |
| | | D | නුවරඑළිය |

1. B, A, C    2. D, B, A    3. A, D, C    4. B, A, D    (..............)

20. ශ්‍රී ලංකාවේ වැවිලි බෝග "අ" තීරුවේ දැක්වෙන අතර එම වගාවන් සඳහා යෝග්‍ය පස "ආ" තීරුව හා ගැලපූ විට ලැබෙන පිළිතුර තත් ඉර මත ලියන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | තේ | A | ලවණ මිශ්‍ර වැලි පස. |
| 2. | පොල් | B | කබොක් මිශ්‍ර වැලි පස |
| 3. | රබර් | C | ලොම් ලැටරයිට් පස |
| | | D | දියඑ පස |

1. A, C, B    2. B, C, A    3. C, A, B    4. C, A, D    (..............)

- **21 සිට 25 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21. ශ්‍රී ලංකාවේ වැඩිම දිග පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුව දක්වා කිලෝමීටර් ........................................ කි.

www.edudept.up.gov.lk


22. ශ්‍රී ලංකා තේ ලෝකයේ හොඳම තේ නිෂ්පාදකයා ලෙස ........................................... ලකුණින් වෙළඳපොළට හඳුන්වා දී ඇත.

23. නොරින් - 10 යනු ....................................... විශේෂයකි.

24. ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාරය .............................. බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යි.

25. වර්තමානයේ මුළු ලෝක ජනතාවම එකම විශ්ව ගම්මානයක් බවට පත්වීම ......................................... නමින් හඳුන්වයි.

- **අංක 26 සිට 27 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න .**




26. ලක්විජය තාප විදුලිබලාගාරය පිහිටා ඇති දිස්ත්‍රික්කය .......................... අක්ෂරයෙන් දැක් වේ.


27. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන්නේ ......................... අක්ෂරයෙනි.

- **2008 සිට 2013 දක්වා දල දේශීය නිෂ්පාදනයේ සංයුතිය දැක්වෙන ප්‍රස්තාරය පහත දැක්වේ. එය හොඳින් අධ්‍යනය කොට අංක 28 සිට 30 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

28. ප්‍රස්තාරයට අනුව සේවා අංශයේ වැඩිම ආදායමක් ලබා දී ඇත්තේ .......................... වසරේදි ය.

29. ප්‍රස්තාරයට අනුව අඩුම දායකත්වයක් ලබා දී ඇත්තේ .......................... අංශයෙනි.

30. සෑම වසරකම ඉතා සීඝ්‍රයෙන් ඉහළ නැගීමක් ...................... අංශයෙන් පිළිඹිබු වේ.




2008 - 2013 දක්වා දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය

මූලය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2015

- **31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31. අන්තර්ජාතික වෙළඳාමේ දී වැඩි වශයෙන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනෙන්නේ,
   1. ගුවන් ප්‍රවාහනය යි.
   2. නාවික ප්‍රවාහනය යි.
   3. දුම්රිය ප්‍රවාහනය යි.
   4. ගොඩබිම් ප්‍රවාහනය යි. (............)

32. ශ්‍රී ලංකාවේ ජන සංගනනයක් පවත්වන්නේ වසර,
   1. 10 කට වරක් ය.
   2. 15 කට වරක් ය.
   3. 12 කට වරක් ය.
   4. 11 කට වරක් ය. (............)

33. ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාතික වැදගත්කමක් ඇති (රැම්සාර්) තෙත් බිම් වශයෙන් ප්‍රකාශිත ස්ථාන තුන නම් ආනවිලුන්දාව අභයභූමිය, මාදුගඟ සහ,
   1. යාල ය.
   2. බුන්දල ය.
   3. වස්ගමුව ය.
   4. කුමන ය. (............)

34. කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කවල අධික ජන සංක්‍රමණයක් පැවතීමට ප්‍රධාන හේතුව වනුයේ,
   1. රැකියා අවස්ථා බහුල වීම.   2. උපත් අනුපාතය ඉහළ යාම.
   3. පුමිතිරි අනුපාතය වෙනස්වීම.   4. ආයු අපේක්ෂාව ඉහළ යාම.   (.............)

- **අංක 35 හා 36 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගි කර ගන්න.**
   A - භූමි පරිභෝජනය
   B - ජනගහනය
   C - ඒක පුද්ගල ඉඩම් පරිභෝජනය
   D - මුඩුක්කු නිවාස හා පැල්පත් නිවාස බිහිවීම.

35. එක් කරුණක වැඩිවීම තවත් කරුණක අඩුවීමට හේතුවන පිළිතුර වනුයේ,
   1. A හා D ය   2. A හා C ය   3. B හා C ය   4. A හා B ය
   (.............)

36. එක් කරුණක වැඩිවීම හේතුවෙන් භූමි පරිභෝජනය ඉහළ යන අතර ඒ හේතුවෙන් වෙනත් කරුණක වැඩිවීමක් දැකිය හැකිය. එම කරුණු දෙක ඇතුළත් පිළිතුර වනුයේ,
   1. A හා D ය   2. C හා B ය   3. A හා B ය   4. B හා D ය
   (.............)

37. ලෝකයේ විශාලතම "ලවණ විල" ලෙස හඳුන්වන්නේ,
   1. බයිකල් විල යි.   2. ඒරල් මුහුද යි.
   3. කැස්පියන් මුහුද යි.   4. පංචමහා විල් ය.   (.............)

38. ශ්‍රී ලංකාවේ තනි බෝගයක් ලෙස වැඩිම බිම් ප්‍රමාණයක් වගා කොට ඇත්තේ,
   1. වී වගාව යි.   2. තේ වගාව යි.
   3. පොල් වගාව යි.   4. රබර් වගාව යි.   (.............)

39. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික බල ශක්ති අවශ්‍යතාවයෙන් 48% කට ආසන්න ප්‍රමාණයක් සපුරාලන බල ශක්ති සැපයුම වන්නේ,
   1. ඛනිජ තෙල් ය.   2. ජල විදුලි ශක්තිය යි.
   3. ජෛව ස්කන්ධය යි.   4. තාප බල ශක්තිය යි.   (.............)

40. ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු තීරය වෙරළෙහි සිට විහිදී යන නාවික සැතපුම් ගණන වනුයේ,
   1. 24 කි.   2. 20 කි.   3. 16 කි.   4. 12 කි.   (.............)

www.edudept.up.gov.lk